10 වන පිටුවෙන්

අපේ රටේ ආරක්ෂක ල්කම්වරයා ඇමරිකානු පුරවැසියෙක්. ප්‍රවාහන ඇමතිවරයාත් ඇමරිකානු පුරවැසියෙක්. ෆොන්සේකා මහතාව ප්‍රශ්න කරන අය ඒ පුද්ගලයන් ගැන කතා කරන්නේ නැහැ. අනෙක් අතින් විදේශීය කුමන්ත්‍රණයක් පිළිබඳව කෑ මොර දෙන්නේත් මේ බංකොලොත් දේශපාලනඥයෝමයි. විදේශීය කුමන්ත්‍රණයක් සරත් ෆොන්සේකා මහතා පිටුපස තිබෙනවා නම් සියලු විදෙස් බලවේග මේ වන විට ඒ මහතා ජයග්‍රහණය කරවීමට පෙළ ගැසී සිටිය යුතුයි. නමුත් ලංකාවේ දේශපාලනය දෙස අවධානයෙන් සිටින සියලු දෙනා දන්නවා, සිදු වන්නේ එය නොවන බව. සැබවින්ම සිදු වන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුලු ජාත්‍යන්තර සංවිධාන සරත් ෆොන්සේකා මහතාට එරෙහිව ජනමතයක් සකස් කිරීමටත් මහින්ද රාජපක්‍ෂ මහතාට දේශපාලන වාසි සැලසීමටත් ක්‍රියාත්මක වීමයි. ඒ නිසා සැබෑ කුමන්ත්‍රණය ඇත්තේ කොතැනදැයි අපේ රටේ ජනතාව තේරුම් ගෙන සිටිනවා. මේ කුමන්ත්‍රණ කතාවලට ඔවුන් ජනාධිපතිවරණයේදී නිසි පිළිතුරු දෙන බව අපට විශ්වාසයි.

ඔහු (විමල් වීරවංශ) ඔබ පක්ෂය තුල සිටයදීම ආර්ථික වාසි සඳහා පෙනී සිටිමින් හා වෙනත් දේශපාලන වාසි වෙනුවෙන් පක්‍ෂය පාවා දෙමින් පක්ෂය විනාශ කල බව ඔබ පක්ෂයෙන් ඔහුට චෝදනා නගනවා. කරුණු එසේ තිබියදී, ප්‍රතිපත්ති ගරුක, දේශපාලන පරිණත භාවයකින් යුත් දැඩි විනයක් හා හික්මීමක් ඇති ඔබ පක්ෂයේ, ප්‍රචාරක ලේකම් වැනි වගකියයුතු නිළයක් ඔහුට පවරා තිබීම තුල ඔබ පක්ෂය ඔහුට මුලා වී තිබූ බව අපට ඒත්තු යනවා. ඒ ගැන ඔබගේ අදහස කුමක්ද?

විජිත හේරත් : දේශපාලන පක‍ෂයක සිටින සමහර පුද්ගලයින්ගේ වැරදි සහ අඩුපාඩු තිබෙන්න පුළුවන්. අපි උත්සාහ කරන්නේ ඒ පුද්ගලයා රඳවා ගනිමින් ඔහුගේ වැරදි සහ අඩුපාඩු ඉවත් කරන්නයි. මුලින්ම අපි උත්සාහ කළේ ඒකට. නමුත් යම් පුද්ගලයකු නිවැරදි වන්නේ නැතිනම්, දිගටම වැරදි කරනවා නම්, ඒ වගේම පාවා දීමේ දේශපාලනයක නිරත වෙනවා නම් ඔහු ඉවත් කළ යුතුව තිබෙනවා. ඔබ කී සිද්ධියේදී සිදු වුණේ එයයි. වැරදි සහ අඩුපාඩු නිවැරදි කිරීම පිළිබඳව ඕනෑම දේශපාලන පක‍ෂයකට ඇති ක්‍රියාමාර්ගයත් එය පමණයි. එනම් මුලින් වැරැද්ද සමග සටන් කර එය නිවැරදි කිරීම එය නිවැරදි කළ නොහැකි නම් අදාළ පුද්ගලයා ඉවත් කිරීම. පසුගිය සිදුවීම්වලදී ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියාත්මක වුණේ ඒ මූලධර්මයට අනුවයි.

සන්නසඃ රාජ්‍ය ආයතන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන හා සියලුම මාධ්‍ය ආයතන පක්ෂග්‍රාහී ලෙස දේශපාලනීකරණයවී ඇති බව පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. මෙම ආයතන වල අපක්ෂපාතීත්වය විනිවිද පෙනෙන ලෙස නැවත ස්ථාපිත කිරීමට හා පවත්වා ගෙන යාමට නිර්පාක්ෂික පොදු අපේක්ෂක ජනරාල් (විශ්‍රාමික) සරත් ෆොන්සේකා මහතා ජයග්‍රහණය කලහොත් හැකිවේයයි ඔබ සිතනවාද?

විජිත හේරත් : රාජ්‍ය ආයතන, රාජ්‍ය සේවකයින් හා රාජ්‍ය සම්පත් අයිති බලයේ සිටින දේශපාලන පක‍ෂයට නොවෙයි. සමස්ත රටටම. ඒ නිසා විශේෂයෙන් මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවකදී ඒවා අපක‍ෂපාතීව ක්‍රියාත්මක විය යුතුයි. නමුත් ලංකාවේදී අප දන්නා ඉතිහාසයේ හැමදාමත් සිදු වුණේ රාජ්‍ය දේපළ හා රාජ්‍ය සේවය බලය හොබවන පක‍ෂය විසින් භාවිත කිරීම. එය සිදු වන්නේ රජයේ නිලධාරීන්ගේ කැමැත්තට අනුව නොවෙයි. ඔවුන්ට ඒ සඳහා විශාල බලපෑමක් එල්ල වෙනවා. ඒ බලපෑම ඉවත් කළ හැකි නම් රාජ්‍ය සේවයේ, පොලිසියේ, අධිකරණයේ ස්වාධීනත්වය සුරක‍ෂිත කළ හැකියි. ඒ නිසා එම ආයතනවල බඳවා ගැනීම්, උසස්වීම් ලබා දීම, මාරු කිරීම් ආදිය තීරණය කිරීමේ බලය ස්වාධීන කොමිෂන් සභාවකට පැවරිය යුතු යැයි පාර්ලිමේන්තුවේ බහුතරයේ කැමැත් තෙන් තීරණයක් ගනු ලැබුවා. එය අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ලැබූ දැවැන්ත ජයග්‍රහණයක්. නමුත් අද ඒ ජයග්‍රහණයේ ප්‍රතිඵල ජනතාවට හිමි වන්නේ නැහැ. ස්වාධීන කොමිෂන් සභා පත් කළ යුතුව තිබෙන්නේ ව්‍යවස්ථාදායක සභාව මගින්. තවමත් එම ව්‍යවස්ථා දායක සභාවට ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු නියෝජිතයා පත් කර නැහැ. ඒ නිසා 17 වන ව්‍යවස්ථා සංශෝධනය දැන් ක්‍රියාත්මක වන්නේ නැහැ. කොමිෂන් සභා අක්‍රිය වී තිබෙනවා. නිර්පාක‍ෂික පොදු අපේක‍ෂකයා ජනාධිපති ධුරයට පත් වූ වහාම ව්‍යවස්ථා දායක සභාවට නියෝජිතයින් පත් කර ස්වාධීන කොමිෂන් සභා සක්‍රිය කරනවා. ඔහු නිර්පාක‍ෂික පුද්ගලයකු නිසා ඔහුට ඊට අදාළ බාධාවන් පැන නගින්නේ නැහැ. ඒ නිසා මෙවර එය ක්‍රියාත්මක කළ හැකි යැයි අපට තදබල විශ්වාසයක් තිබෙනවා.

සන්නසඃ පසුගිය පළාත් සභා මැතිවරණ ප්‍රථිඵල වලට අනුව පවතින රජය 70% ක විශිෂ්ඨ ජයග්‍රහණයක් හිමිකරගත් බව දකින්නට ලැබුනා. ඔබ පක්‍ෂය සහයෝගය දෙන නිර්පාක්ෂික පොදු අපේක්‍ෂක ජනරාල් (විශ්‍රාමික) සරත් ෆොන්සේකා මහතා මෙවැනි ප්‍රතිශතයක් අභිබවා ජයග්‍රහණය ලබා ගන්නේ කෙසේද?

විජිත හේරත් : පළාත් සභා මැතිවරණවලදී සහ ජනාධිපතිවරණවලදී ඡන්ද දායකයා හැසිරෙන ආකාරය එකිනෙකට වෙනස්. ඒ නිසා පළාත් සභා මැතිවරණ ප්‍රතිඵල මත පදනම්ව ජනාධිපතිවරණයේ ප්‍රතිඵල අනුමාන කිරීම නිවැරදි නැහැ. අනෙක් අතින් පසුගිය පළාත් සභා මැතිවරණ සියල්ලම පාහේ පැවැත් වූයේ යුද්ධය අතරතුර සහ යුද්ධයේ ජයග්‍රහණයත් සමග. ආණ්ඩුව නැගෙනහිර, උතුරුමැද, සබරගමුව, මධ්‍යම, වයඹ, බස්නාහිර වැනි සෑම පළාත් සභා මැතිවරණයකදීම පුන පුනා පැවසුවේ යුද්ධය ඉදිරියට ගෙන යාමට කැමැත්ත පළ කිරීම සඳහා සන්ධානය දිනවන ලෙසයි. ඌව හා දකුණ පළාත් සභාවලදී ආණ්ඩුව කීවේ යුද ජයග්‍රහණය අනුමත කිරීමට සන්ධානය දිනවන ලෙසයි. අපේ රටේ ජනතාවගෙන් 99%ක්ම ත්‍රස්තවාදය පරාජය කළ යුතු බව පිළිගන්නවා. ඒ නිසා ඒ වෙනුවෙන් ඡන්දය ඉල්ලන ජනමත විචාරණයක් බවට පළාත් සභා මැතිවරණ පත් කර ගත්තාම ආණ්ඩුවට මීටත් වඩා ඡන්ද ප්‍රතිශතයක් හිම විය යුතුව තිබුණා. නමුත් දැන් යුද්ධය අවසන් නව පරිච්ඡේදය තුළ ජනතාව අපේක‍ෂා කළ කිසිවක් ඉටු කිරීමට ආණ්ඩුව සමත් වී නැහැ. ජනතාව රාජපක‍ෂ පාලනය පිළිබඳව අපේක‍ෂා භංගත්වයටපත් වී තිබෙනවා. ඒ වගේම නිර්පාක‍ෂික පොදු අපේක‍ෂකයා පෙනී සිටින්නේ ත්‍රස්තවාදයෙන් මුදාගත් රට නව පරිච්ඡේදයක් කරා ගෙනයාමට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ඉටු කිරීමටයි. ඒ නිසා ජනතාව ඔහු ගැන විශ්වාසය තබා සිටිනවා. ඔහුගේ ජයග්‍රහණය අනිවාර්ය බව මේ ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය දෙස බලන ඕනෑම අයකුට හොඳින් පැහැදිලි වෙනවා.

සන්නසඃ උතුරු නැගෙණහිර දෙමළ ජනතාවගෙ ඡන්දය මෙම ජනාධිපතිවරණයේදී ජනාධිපතිවරයා පත්කරන තීරක සාධකය වියහැකියි. ඒ ගැන ඔබගෙ අදහස පැහැදිලි කරන්න.

විජිත හේරත් : උතුර හා නැගෙනහිර පමණක් නොවෙයි රටේ හැම තැනම සිටින ජනතාවගේ ඡන්ද තීරණාත්මකයි. මෙවර ඉදිරිපත්වී සිටින පොදු අපේක්ෂකයා නිර්පාක්ෂික පොදු අපේක්ෂකයෙක් නිසා දේශපාලන පක්ෂ ගණනාවක වගේම සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලු ජන කොටස්වල සහය ඔහුට හිමිව තිබෙනවා. උතුර දකුණ, නැගෙනහිර, බස්නාහිර හැම පළාතකම ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් යහ පාලනය වෙනුවෙන්, පොදු අපේක්ෂකයා සමඟ එක්වී සිටිනවා. ඒ නිසා ඔහුගේ ජයග්‍රහණය ස්ථිරයි.

සන්නසඃ පසුගියදා මහින්ද රාජපක්ෂ හා ඩග්ලස් දේවානන්ද අතර අත්සන් කලායැයි කියන රහස් ගිවිසුමක් ගැන උතුරේ මැතිවරණ ව්‍යාපාරයේදී ඩග්ලස් දේවානන්ද ඇමතිවරයා විසින් හෙළිදරව් කර තිබෙනවා. මේ ගැන යමක් ඔබට කිව හැකිද?

විජිත හේරත් : මෙම ප්‍රශ්නයට අදාල පිළිතුර කලින් ප්‍රශ්නයක ලබාදී ඇති නිසා එයට වෙනම පිළිතුරු දී නැත.

සන්නසඃ අවසන් වශයෙන් ඔස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති ජනතාවට මෙම තීරණාත්මක ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ඔබට දීමට ඇති පණිවුඩය කුමක්ද?

විජිත හේරත් : අපේ රට බෙදුම්වාදී ත්‍රස්තවාදය පරදවා පසුගිය කාලයේ ලබා ගත් ජයග්‍රහණවලදී විදේශගත ශ්‍රී ලාංකිකයින් විශාල මෙහෙවරක් ඉටු කළා. ඔවුන් ගේ දායකත්වය නොවන්නට මේ ජයග්‍රහණය තව තවත් දුෂ්කර විය හැකිව තිබුණා. දැන් අපි තිස් වසරක් තිස්සේ රට පීඩාවට පත් කළ යුද්ධය අවසන් කර තිබෙනවා. දැන් කළ යුතුව තිබෙන්නේ යුද්ධයෙන් විනාශ වූ රට ගොඩනැගීමයි. ඒ සඳහා වංචාව, දූෂණය, නාස්තිය පිටු දැක යහපාලනය තහවුරු කිරීමයි. ඒ වගේම යළි බෙදුම්වාදයට හිස එසවිය නොහැකි සේ ජාතික සමගිය ගොඩනැගීමයි. ඒ වගේම ජනතාවට අයිතීන් ලබාදීමයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමයි. දැන් අපේ රට ඉදිරියේ ඇති අලුත් යුද්ධය ඒ ප්‍රජාතන්ත්‍රවාදී හා ශීඝ්‍ර සම්පන්න සමාජය ගොඩනැගීමේ යුද්ධයයි. ඒ යුද්ධය ජය ගැනීමටත් විදේශ ගතව සිටින ඔබ සැම දෙනාගේ දායකත්වය ලැබෙනු ඇතැයි අපි අපේක‍ෂා කරනවා. ඒ දායකත්වය අවශ්‍යමයි, ඔබේ උපන් රට වෙනුවෙන් ඒ දායකත්වය ලබාදීම ඔබේ වගකීමක්ව තිබෙනවා.


# Migration Solutions

Are you, your friend or your relative seeking solutions for....?

- Students visa issues
- Family migration(parent, spouse etc)
- Skilled Migration (Onshore and Offshore)
- Visitor visa
- Visa cancellations issues (MRT Reviews)

Honest, reliable service assured, at affordable rates.

Call: 61 3 9547 3022

MIA
Member of Migration Institute of Australia



Manoj Dodamgoda

AUSGATE
Migration Consultancy Services

Grad.Cert. (Immi. Law), BIT
Member of Migration Institute of Australia
MARN: 0854504

No. 9/61-63 Buckley Street, Noble Park, Victoria 3174, Australia
Tel: 61 3 9547 3022 Mob: 61 430 642 774 Fax: 61 3 9547 3022
Email: manoj@ausgatemig.com.au